ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමා විසින් 2016 ජුනි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 මාර්තු මස 08 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

**[116 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 3.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 0010024—475 (2016/06)

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** **:** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 431 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ-

(අ) 29 වන වගන්තිය යටතේ ගනු ලැබූ හෝ සොරකම් කරන ලද හෝ දේපළ තහනමට ගනු ලැබූ විට ඒ දේපළ සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් ඔහුගේ හිමිකම් පෑම තහවුරු කර දක්විය යුතු කාලසීමාව අඩු කිරීම සඳහා විධිවිධාන සැලසීම ; සහ

(ආ) එම වගන්තිය යටතේ නිවේදනයක් පළ කළ යුතු දේපළෙහි වටිනාකම වැඩි කිරීම,

වේ.

***3 වන වගන්තිය*** **:** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 432 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් එම වගන්තියේ පැති සටහනට ආනුෂංගික සංශෝධනයක් සිදු කරනු ලැබේ.

එල්. ඩී.—ඕ. 44/2015

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2016 අංක    දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1979 අංක 15 දරන පනතේ 431 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 431 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "මාස හයක් ඇතුළත" යන වචන වෙනුවට "මාස දෙකක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "රුපියල් දෙදහස් පන්සියයක් හෝ ඊට වැඩි වන්නේ නම්" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක් හෝ ඊට වැඩි වන්නේ නම්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 432 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 432 වන වගන්තිය, එහි පැති සටහන ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"මාස දෙකක් ඇතුළත කිසිම හිමිකම්පාන්නකු පෙනී නොසිටින අවස්ථාවක කාර්ය පටිපාටිය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2—PL 009775—425 (2016/02)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.